# දෙමව්පියන්ගේ විදේශගත වීම පවුල් වල නව යොවුන් වියේ පසුවන දරුවන්ගේ අධ්‍යාපන සාධනය කෙරෙහි බලපාන ආකාරය පිළිබඳ අධ්‍යයනයක්

**ජේ. එච්. එම්. සී. පී. ජයපත්ම**[1]

**සංක්ෂේපය**

ආසියාවේ පුරුෂයන් ප්‍රමාණයට වඩා කාන්තාවන් විශාල ප්‍රමාණයක් විදේශගත වීම දැක ගත හැකිය. මොවුන්ගෙන් වැඩි ප්‍රතිශතයක් ගෘහසේවය සඳහා විදේශගත වුවන් ය. ආර්ථික වෘද්ධිය අතින් බැලීමේ දී මෙලෙස ශ්‍රී ලාංකික ප්‍රජාවගේ විදෙස්ගත වීම බෙහෙවින් ඵලදායක ක්‍රියාදාමයකි. නමුත් මෙලෙස විශේෂයෙන්ම මව විදෙස්ගත වීම බොහෝ ගැටලු රාශියකට මග පාදන්නකි. මෙලෙස පවුල්වල දෙමව්පියන්ගේ විදේශ ගතවීම හේතුවෙන් දරුවන්ගේ මූලික මානසික අවශ්‍යතා ඉටු නොවීම නිසා එය ඔවුන්ගේ අධ්‍යාපනයට අහිතකර ලෙස බලපෑම් එල්ලකර ඇත. එකියා සඳහා මෙලෙස දෙමව්පියන්ගේ විදෙස්ගත වීම පවුල්වල නව යොවුන් වියේ පසුවන දරුවන්ගේ අධ්‍යාපන සාධනය කෙරෙහි බලපාන ආකාරය පිළිබඳ අධ්‍යනයක් සිදු කිරීම මෙම පර්යේෂණයෙහි මුලික අරමුණ වේ. මේ සඳහා නියැදිය වශයෙන් තෝරා ගන්නා ලද්දේ කුරුණෑගල දිස්ත්‍රික්කයේ කොටවෙහෙර ග්‍රාමය යි. දෙමව්පියන් විදේශගත වු පවුල්වල දරුවන් 20 ක් සහ දෙමව්පියන් විදේශගත නොවු පවුල් වල දරුවන් 20 ක් සසම්භාව්‍ව නියැදිය වශයෙන් තෝරාගෙන දෙමව්පියන් විදේශගත වීමට පෙර සහ පසු ඔවුන්ගේ අධ්‍යාපන සාධන මට්ටම්වල ඇති වු වෙනස් වීම් මෙහිදී විමසා බලන ලදී. ප්‍රශ්නාවලි සහ ලේඛන පරික්ෂා කිරීමෙන් අධ්‍යනයට අවශ්‍ය දත්ත එක් රැස් කර ගැනීමට හැකියාව ලැබුණි. ලබාගත් සියලුම දත්ත මධ්‍යනයය , සම්මත අපගමනය හා ප්‍රතිශතක වැනි සංඛ්‍යා විද්‍යාත්මක ක්‍රම භාවිතයෙන් ප්‍රමාණාත්මකව සහ ගුණාත්මකව විශ්ලේෂණය සිදු කරන ලදී. පර්යේෂණය අවසානයේදී අනාවරණය කර ගත් තොරතුරු වලට අනුව නිගමනය කල හැකි වුයේ, දෙමව්පියන් විදේශගත වීම අඩු ආදායම්ලාභී පවුල් වල ජීවන තත්වය ඉහළ නැංවීමට හේතු වු නමුත් දරුවන්ගේ අධ්‍යාපන තත්වය කෙරෙහි අහිතකර ලෙස බලපා ඇති බවයි. දෙමාපියන් විදේශගත වීම නිසා දරුවන්ගේ සාධනය වැඩි දියුණු වී ඇත්තේ දරුවන්ගෙන් 15% ගේ පමණි. 10% ගේ සාධනයෙහි කිසිදු වෙනසක් සිදු වී නොමැත. දරුවන්ගෙන් 75% ගේ සාධනය දුර්වල වී ඇත. දෙමාපියන් විදේශගත වීමේ එක් අරමුණක් වුයේ, තම දරුවන්ට අධ්‍යාපනය ලබා දීමයි. එහෙත් මෙම අධ්‍යනයට අනුව දෙමව්පියන් විදේශගත වීම දරුවන්ගේ අධ්‍යාපන සාධනය කෙරෙහි අහිතකර අයුරින් බලපා ඇති බව අනාවරණය විය.

**මුඛ්‍ය පද :** විදේශගත වීම, දරුවන්, අධ්‍යාපනය

[1] ආර්ථික විද්‍යා අධ්‍යයන අංශය, කැලණිය විශ්වවිද්‍යාලය, jayapathma95@gmail.com